ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි යොමු අංකය: 1920-009

2019 ඔක්තෝබර් 11

දයාබර දෙමව්පියන් වෙත,

**<u>ඔබගේ දරුවා දහම් පාසලට නොපැමිණීම දැනුම් දීම සම්බන්ධයෙනි:</u>**

මොනයම් හේතුවකට හෝ ඔබගේ දරුවා දහම් පාසලට නොපැමිණෙන්නේ නම් ඒ බව අප වෙත දැනුම් දීම ඔබගේ යුතුකමක් වනු ඇත. අප වෙබ් අඩවියේ සපයා ඇති <u>විශේෂ පෝරමයක්</u> මගින් දහම් පාසලට නොපැමිණෙන දිනයන් අපවෙත පහසුවෙන් දැනුම් දීමට දැන් ඔබට හැකිවනු ඇති අතර email මගින් දැන්වීම අවශ්‍ය නොවනු ඇත.




ඔබ විසින් මෙලෙස කරනු ලබන දැන්වීම අප දහම් පාසලේ කොන්දේසි මාලාවේ 7 වැනි කොන්දේසිය පිළිපැදීමක් වන බව කරුණාවෙන් සලකන්න. කෙසේවුවද, ඔබ විසින් මෙලෙස කරනු ලබන දැන්වීම අප දහම් පාසලේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය සම්පූර්ණ වීමක් නොවන බව කරුණාවෙන් සලකන්න.

ඔබගේ පහසුව සඳහා අප දහම් පාසලේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය සහ 7 වැනි කොන්දේසිය පහතින් සඳහන් කර ඇත.

> *“6. අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා දරුවන් දිනපතා පාසලට පැමිණීම අත්‍යාවශ්‍ය වනු ඇත. අධ්‍යයන වසර ඇතුළත දහම් පාසල පැවැත්වෙන දින ප්‍රමාණයෙන් 70% කට වැඩියෙන් සහභාගී වන දරු දැරියන් හට පමණක් වර්ෂ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් විය හැකි බවත්, ඒ අනුව ඉහළ පන්තියට අනුගත කිරීම සිදු කෙරෙන බවද කරුණාවෙන් සලකන්න.*
>
> *7. දැනුම් දීමකින් තොරව නොකඩවා දින තුනක් (3) පාසලට නොපැමිණෙන දරුවන් පාසල හැර ගියාසේ සලකනු ඇත. එම දරුවන් නැවත පාසලට ඇතුළත් කරවීමට අවශ්‍ය නම් මීළඟ පාසල් වාරයේදී අලුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.”*

ස්තුතියි

සංවිධායක මණ්ඩලය, ඩුබායි දහම් පාසල